०२
द्वितीयः पाठः।

# विद्या धर्मेण शोभते।

## कारकपरिचयः। ०१


වාක්‍යයක භාවිත වන නාම හා ක්‍රියාවන් අතර සම්බන්ධය දැක්වීම කාරක නම් වේ. කිසියම් නාමයක් ආඛ්‍යාතය සමග කිසිදු සබඳතාවක් නොමැති නම් එහි කාරක ස්වභාවයක් නොමැත. **ක්‍රියා නිෂ්පත්තියට හේතුවීම, ක්‍රියාසිද්ධියට අතිශයින් උපකාරීවීම** යන අර්ථලාභය කාරක තුළ පවතී. **(ක්‍රියාසිද්ධ්‍යුපකාරකං කාරකම්)**


සංස්කෘත භාෂාවේ විභක්ති හතක් ඇත. සම්බෝධන (ආලපන) උප විභක්තියකි. නාමයන් විවිධ අර්ථවලට බෙදීම ඒවායින් සිදු වේ. එබඳු ප්‍රත්‍ය විසිඑකකි. කාරක හා පවතින සම්බන්ධය පෙන්වීම සඳහා මෙම විභක්ති යොදා ගැනේ. ඉන් ප්‍රථමාවේ ම භේදයක් වන සම්බෝධන (ආලපන) හා ෂෂ්ඨී විභක්ති කාරක ගණයට නොගැනේ. ඒවායින් ක්‍රියාවකට උපකාරයක් නොලැබෙන බැවිනි. සෙසු විභක්ති හයට අදාළ කාරක හයකි.

1. කර්තෘ (ක්‍රියාව සිදුකිරීම් වශයෙන් සම්බන්ධ වේ.)
2. කර්ම (ක්‍රියාර්ථයට යටත්වීම් වශයෙන් සම්බන්ධ වේ.)
3. කරණ (ක්‍රියාවට සහාය වීම වශයෙන් සම්බන්ධ වේ.)
4. සම්ප්‍රදාන (ක්‍රියාවේ ඵලය ලැබීම්වශයෙන් සම්බන්ධ වේ.)
5. අපදාන (ක්‍රියාර්ථයට සීමාවීම් වශයෙන් සම්බන්ධ වේ.)
6. අධිකරණ (සුදුසු පරිදි කර්තෘ හා කර්මයන් දැරීම් වශයෙන් සම්බන්ධ වේ.)

ඇතැම් අවස්ථාවන්හි දී කාරකය වාක්‍යයක් ඇතුළත නාමයක විභක්තිය කුමක් විය යුතුදැයි යන්න පවා තීරණය කරයි.

උදාහරණ :-






■ පහත නිදර්ශන සාවධාන ව අධ්‍යයනය කරන්න.

- ශිෂ්‍යයා සැප කැමති වෙයි. छात्रः सुखम् इच्छति। උක්තය ලෙස
- ගුරුවරයා පොතක් කියවයි. आचार्यः पुस्तकं पठति। කර්මය ලෙස
- ශිෂ්‍යයා විසින් පොත හදාරනු ලැබේ. छात्रेण पुस्तकः पठ्यते। කර්තෘ ලෙස
- ගුරුවරයා ශිෂ්‍යයා නිසා සතුටු වෙයි. शिक्षकः छात्रेण तुष्यति। කරණ ලෙස
- ගුරුවරයා ශිෂ්‍යයාට තෑග්ගක් දෙයි. अध्यापकः छात्राय वितरणं ददाति। සම්ප්‍රදාන ලෙස
- නොදන්නාකම ශිෂ්‍යයාගෙන් බැහැරවෙයි. मूढत्वं छात्रात् बहिर्गच्छति। අපාදාන ලෙස
- ගුරුවරයා ශිෂ්‍යයා කෙරෙහි සෙනෙහස දක්වයි. गुरुः छात्रे स्निह्यति। ආධාර ලෙස

## 01. ප්‍රථමා විභක්තිය (කර්තෘකාරකය)

■ ලිංගාර්ථයෙහි ප්‍රථමා ව යෙදේ.
■ උක්තාර්ථයෙහි ප්‍රථමා ව යෙදේ.
■ සම්බෝධනයෙහි ප්‍රථමා ව යෙදේ.

- කර්ම හා කර්තෘ ආදි වෙනත් අවස්ථාවකට පත් නොවූ ශබ්ද ප්‍රකෘතීන් මෙහි ලිංගාර්ථ නම් වේ. ඒවා ප්‍රකාශ කළ යුතු කල්හි ප්‍රථමාවෙන් යොදනු ලැබේ.

**नर - नरः**
**वनिता / ज्ञानम् / तटः / तटी / तटम् / कुलम् / एकः / द्वौ / बहवः**

- අවසාන ක්‍රියාවෙන් උක්ත වන නාමය ප්‍රථමා විභක්තිය ගනී. කර්තෘකාරක වාක්‍යයක කර්තෘ ද, කර්මකාරක වාක්‍යයක කර්මය ද ප්‍රථමා විභක්තියෙන් සිටී.

वरं बुद्धिर्न सा विद्या विद्यया बुद्धिरुत्तमा ।
बुद्धिहीना विनश्यन्ति यथा ते सिंहकारकाः ॥

- ආමන්ත්‍රණයෙහි ද ප්‍රථමා ව යෙදේ.

गच्छ गच्छसि चेत् कान्त पन्थानः सन्तु ते शिवाः ।
हे देव मां रक्ष ।

- नरो विदेशं गच्छति ।
- भूपालः सिंहासने तिष्ठति ।
- हे शिष्य पुस्तकं पठ ।
- लता परोपकाराय पुष्पयति ।
- धेनुः क्षीरं वितरति ।
- हे कन्ये कूपं गच्छ ।

**ක්‍රියාකාරකම 2.1**

01. ඉහත සඳහන් වාක්‍යයන්හි ඇති උක්ත පද වෙන වෙන ම ලියා දක්වන්න.
02. ඉහත සඳහන් වාක්‍යවල ආලපන විභක්ති පද වෙන වෙන ම ලියා දක්වන්න.
03. ඉහත සඳහන් වාක්‍යවල පුරුෂලිඞ්ග, ස්ත්‍රීලිඞ්ග, නපුංසකලිඞ්ග වචන (ප්‍රථමා විභක්ති පද) වෙන වෙන ම වගුගත කරන්න.

| පුරුෂලිඞ්ග | ස්ත්‍රීලිඞ්ග | නපුංසකලිඞ්ග |
|---|---|---|
| | | |
| | | |

- පරිමාණවාචී පද ද යෙදෙන්නේ ප්‍රථමාවෙනි.

किञ्चिद् द्रोणः आढकम्
किञ्चित् कालोपभुक्तम् ।

- අව්‍යයන් හා යෙදීමේ දී ද ප්‍රථමා ව වේ.

महासेनो नाम राजा बभूव ।

• මාතෘකා, නාම පුවරු, ග්‍රන්ථනාම, කෝෂ ග්‍රන්ථ පද ආදිය ද ප්‍රථමාවෙන් ලියනු ලැබේ.

श्री लङ्काद्वीपः।
महाकविकालिदासः
भदन्ताश्वघोषप्रणीतबुद्धचरितमहाकाव्यम्।
पुस्तकालयम्।
सर्वज्ञः सुगतो बुद्धो धर्मराजस्तथागतः

## 02. ද්විතීයා විභක්තිය (කර්මකාරකය)

කර්තෘ ස්වකීය ක්‍රියාව මගින් ඍජුව ම යම් අර්ථයක් වෙත සමීප වේ ද එය කර්මය යි.

बुद्धं नमति बालकः। चन्द्रं पश्यति बालिका।

1. උත්පාද්‍ය, 2. ආප්‍ය ය, 3. විකාර්ය, 4. සංස්කාර්ය **යනුවෙන් කර්මය සිවු ආකාර වේ.**

• කලින් නොපැවති යමක් අලුතෙන් ඇති කරයි ද එය උත්පාද්‍ය කර්ම නම් වේ.

करोति कर्षकः हलम्।

• පෙර පැවති දෙයකට අනුකූල වීම ආප්‍ය ය නම් වේ.

प्रविशति वनं सिद्धार्थः।

• යමක් පවත්නා තත්ත්වයෙන් වෙනස් තත්ත්වයකට පෙරළීම විකාර්ය නම් වේ.

तिलान् पिनष्टि माता।

• පැවති ගුණයක් ක්‍රියාවකින් වෙනස් කිරීම සංස්කාර්ය නම් වේ.

वस्त्रं क्षालयति पुरुषः।

- व्याघ्रो मृगं हन्ति।
- नारी आहारं पचति।
- नन्दो बुद्धम् अनुगच्छति।
- शिशुः दुग्धं पिबति।
- सीलानन्दः श्वेतवस्त्रं रञ्जयति।

**ක්‍රියාකාරකම 2.2**

01. ඉහත වාක්‍යවල ඇති කර්මපද වෙන වෙන ම ලියන්න.
02. පහත සඳහන් වගුවේ හිස්තැන් පුරවන්න.

| විභක්තිය | ඒකවචන | ද්විවචන | බහුවචන |
|---|---|---|---|
| ද්විතීයා | मृगं | मृगौ | मृगान् |
| ................. | ................. | आहारे | आहाराणि |
| ................. | बुद्धं | बुद्धौ | ................. |
| ................. | दुग्धं | ................. | दुग्धानि |
| ................. | श्वेतवस्त्रं | ................. | ................. |

• අකථිත කර්මය ද්විතීයාවෙන් සිටී. ද්විකර්මක ධාතු යෝගයෙහි ප්‍රධාන හා අප්‍රධාන වශයෙන් කර්ම පද දෙකක් පවතී. ඉන් අප්‍රධාන කර්මය අකථිත කර්මය යි. ද්විකර්මක ධාතු දහසයක් ද ඇත.

दरिद्रः प्रभुं धनं याचते। ( प्रभुं - අප්‍රධාන කර්මය )
गां दोग्धि पयः। ( गां - අප්‍රධාන කර්මය )

**ක්‍රියාකාරකම 2.3**

- गोपालो गां क्षीरं दोग्धि।
- याचको धनिकम् आहारं याचति।
- गुरुः शिष्यं प्रत्युत्तरं पृच्छति।
- सर्वज्ञः श्रावकान् धर्मं शासति।
- चोरो धनिकं भाण्डानि गृह्णाति।
- मालाकारो वृक्षं पुष्पं चिनोति।
- पिता पुत्रं गृहं नयति।

01. ඉහත වාක්‍යයන්හි ඇතුළත් ප්‍රධාන හා අප්‍රධාන කර්මපද වෙන වෙන ම ලියා දක්වන්න.
02. ද්විතීයා විභක්තියෙන් පද දෙකක් යෙදී ඇත්තේ කවර හේතුන් නිසා ද?
03. ද්විකර්මක ධාතු දහසය ලියන්න.
04. පහත වාක්‍යවල හිස්තැන්වලට සුදුසු වචන වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.

(वहति / अहं/ अमात्यः/ धनलाभं/ वृक्षम्/ स्वक्षेत्रं/ गजः/ धान्यानि / अजयत्/ द्विसहस्रं / सहस्रं)

०१. मार्गारक्षकः सारथिम् ........................... मूल्यं दण्डयति ।
०२. ........................... सेवकं वृक्षम् अवरुनद्धि ।
०३. श्रामणेरः........................... आम्रफलं अवचिनोति ।
०४. ........................... मित्रं सदुपदेशं ब्रवीमि ।
०५. रामः रावणं सीतां...........................
०६. शत्रुः........................... जनहृदान् मथ्नाति ।
०७. वणिक्पुत्रः स्वगृहं........................... मूल्यानि नयति ।
०८. कृषीवलः........................... बीजानि हरति ।
०९. ........................... स्वशाबकान् वनं कर्षति ।
१०. अश्वः स्वस्कन्धं कुमारं...........................
११. सूदाः...........................यागुं पचति ।

යම් කාලයක හෝ ප්‍රදේශයක කඩවීමකින් තොර ව, ක්‍රියාවත් සමග නිතර සබඳතාව පවතින (අත්‍යන්ත සංයෝගී) කාලවාචී සහ මාර්ගවාචී ශබ්ද ද ද්විතීයා විභක්තියෙන් යෙදේ.

मासं नृत्यं अधीते । (කාලවාචී)
क्रोशं कुटिला नदी । (මාර්ගවාචී)

**ක්‍රියාකාරකම 2.4**

०१. तथागतः षट्वर्षं पूर्वारामे अवसत् ।

०२. भोजः पञ्चाशत् पञ्चवर्षं राज्यमकरोत् ।

०३. मासं व्याकरणं अधीते ।

०४. बोधिसत्वः षट्वर्षं दुष्करक्रियायां अयुञ्जत् ।

०५. विष्णुशर्मः षण्मासं पञ्चतन्त्रम् अकथयत् ।

01. ඉහත වාක්‍යන්හි ඇති ද්විතීයා විභක්තිපද ලියා දක්වන්න.
02. එම වචනවල අර්ථ ලියා දක්වන්න.

• වරහන් තුළින් සුදුසු පද තෝරාගෙන පහත වාක්‍ය සම්පූර්ණ කරන්න.

( अवसत् / स्वसेवां / भोजराजः/ वर्षे एव / द्वितीयवर्षे )

०१. आचार्यः पञ्चविंशतिवर्षं.................. अकुर्वत् ।
०२. लङ्कायां.................. त्रस्त्रोपद्रवोऽभवत् ।

०३. यतीन्द्रस्थविरः त्रैमासं विहारेएव .................. ।
०४. सोमसारः द्विवर्षं.................. अपठत्।
०५. .................. पञ्चाशत् पञ्चवर्षं गौडदेशाधिपतिः अभवत्।

- ඇතැම් උපසර්ග සමග ද ද්විතීයා විභක්තිය යෙදේ.

०१. विहारं अभि वृक्षछायां वर्तते।
०२. आलवकः बुद्धं परि भक्तः अभवत्।
०३. कसीभारद्वाजः बुद्धं प्रति आह।
०४. कृष्णः राधां अनु जीवितम्।
०५. चित्तं चित्तं प्रति क्षमा भवतु।

01. ඉහත වාක්‍යවල ඇති ද්විතීයා විභක්ති පද ලියා දක්වන්න.
02. එම වාක්‍යවල ඇති උපසර්ග ලියා දක්වන්න.
03. උපසර්ගය එක්වීමට පෙර හා පසු ද්විතීයා විභක්ති පදයේ අර්ථ වෙනස්වන ආකාරය පැහැදිලි කරන්න.

अभितः / परितः / उभयतः /सर्वतः / निकषा / समया / धिक् / प्रति / अनु / अन्तरेण / यावत् / हा යන නිපාත යෝගයෙහි ද්විතීයා විභක්තිය වේ.

राजानं अभितः मन्त्रिणः
ग्रामं निकषा वनम्।
धिक् धनहीनं जीवितम्।
दीनं प्रति दया कार्या।

## ක්‍රියාකාරකම 2.5

०१. अभितो विहारं उपासकः तिष्ठति।
०२. परितः संघावासं सोमसारः तिष्ठति।
०३. सर्वतः श्रीलङ्काद्वीपं महोदधिः भवति।
०४. उभयतो पथम् अटविं विद्यते।
०५. समया धेनुं वत्सः तिष्ठति।

01. ඉහත වාක්‍යවල ඇති ද්විතීයා විභක්ති පද ලියා දක්වන්න.
02. එම වාක්‍ය සිංහලට පරිවර්තනය කරන්න.
03. මෙම නිපාත භාවිත කරමින් අර්ථවත් වාක්‍ය නිර්මාණය කරන්න.
04. වරහන් තුළින් සුදුසු පද තෝරා පහත වාක්‍යයන්හි හිස්තැන් පුරවන්න.

(अधार्मिकम् / गुरुम् / धर्मम् / अङ्गनम् / मूर्खम्)

०१. निकषा .............................. उपासकः सम्मुखः।
०२. हा .............................. ।
०३. सः धिक् .............................. इति अवदत्।
०४. .............................. अन्तरेण कुतः शान्तिः।
०५. .............................. विना नास्ति पिता च माता।

- ප්‍රයෝජ්‍ය ක්‍රියා සමග ද ද්විතීයා විභක්තිය යෙදේ.

**बोधयति दर्शनं छात्रः**

**ක්‍රියාකාරකම 2.6**

०१. जनाधिपतिः अमात्यं देशान्तरं प्रेशयति।
०२. वैद्यः शिष्यं शयने आसयति।
०३. माता पुत्रं क्षीरान्नं भोजयति।
०४. गुत्तिलः मूषिलं वीणावादनं अवेदयत्।
०५. अङ्गुलिमालः नरान् परलोकं अप्रेषयत्।

01. ඉහත වාක්‍යවල ඇති ද්විතීයා විභක්ති පද ලියන්න.
02. මේ වාක්‍යයන්හි ඇති ප්‍රයෝජ්‍ය ක්‍රියා පද ලියා දක්වන්න.
03. ප්‍රයෝජ්‍යාර්ථවත් වාක්‍ය 05ක් තනන්න.

- පහත සඳහන් ක්‍රියාපදවලට සුදුසු ප්‍රයෝජ්‍ය ක්‍රියා වරහන් තුළින් තෝරා ලියන්න.

| | | |
|---|---|---|
| ०१. | करोति | ..................................... |
| ०२. | वाचति | ..................................... |
| ०३. | पठति | ..................................... |
| ०४. | लिखति | ..................................... |
| ०५. | वन्दति | ..................................... |

(कारयति / वन्दयति / लिख्यति / वाचयति / पाठयति)

- ක්‍රියා විශේෂණය ද්විතීයා විභක්තිය ඇසුරු කරයි. ක්‍රියා විශේෂණ නපුංසක ලිංග ද

ඒකවචන ද වේ.

मधुरं गायति बालिका ।
शीघ्रं धावति युवकः ।
मुनिः सुखं जीवति ।

මෙම වාක්‍යයන්හි හිස්තැන් පුරවන්න.

1. කර්මාර්ථයෙහි ..................... විභක්තිය වේ.
2. ද්විකර්මක ධාතූන් සමග ..................... විභක්තිය යෙදේ.
3. අත්‍යන්ත සංයෝගයෙහි ..................... විභක්තිය යෙදේ.
4. උපසර්ග යෝගයෙහි..................... විභක්තිය යෙදේ.
5. නිපාත යෝගයෙහි ..................... විභක්තිය යෙදේ.
6. ප්‍රයෝජ්‍යක්‍රියා යෝගයෙහි ..................... විභක්තිය යෙදේ.

मित्रंव्यसनसम्प्राप्तं -स्वस्थानंपरपीडितं ।
धन्यास्ते ये न पश्यन्ति - देशभङ्गंकुलक्षयं ॥

**යමෙක් විපතට පත් මිතුරා ද, සතුරන් විසින් වනසන ලද සිය ගෘහය ද, සිය දේශ විනාශය ද, සිය කුලයේ විනාශය ද නොදකී නම් ඔහු භාග්‍යවන්තයෙකි.**

## 03. තෘතීයා විභක්තිය (කරණ කාරකය)

ක්‍රියා සම්පාදනයෙහි දී කර්තෘහට අතිශයින් අනුග්‍රහ දක්වනුයේ කරණය යි. එය තෘතියා විභක්තිය ඇසුරු කරයි.

छात्रः रथेन गच्छति पाठालयम् ।
लेखन्या लिखति सा अक्षरम् ।

අභ්‍යන්තර කරණය හා බාහ්‍ය කරණය යැයි ප්‍රභේද ද්වයකි. ස්වකීය ශරීරාවයවයක් කරණය වේ නම් එය අභ්‍යන්තර කරණය යි.

पादेन गच्छति ।
चक्षुषा पश्यति ।

බාහිර කිසිවක් කරණය වේ නම් එය බාහ්‍ය කරණය යි.

असिना प्रहरति।
चमसा खादति।

මේ අනුව කරණකාරකයෙහි තෘතීයා විභක්තිය වේ.

**ක්‍රියාකාරකම 2.7**

०१. अहं हस्तेन पत्रमृलिखामि।
०२. पथिकाः पादैः देशान्तरं गच्छन्ति।
०३. ग्लानः औषधैः जीवति।
०४. उडुपेन सागरम् तितीर्षुः अस्मि।
०५. शुकः धान्यैः शावकान् पोषयन्ति।

01. ඉහත වාක්‍යවල ඇති තෘතීයා විභක්ති පද ලියන්න.
02. එම වචනවල අර්ථ ලියා දක්වන්න.
03. පහත දැක්වෙන තෘතීයා විභක්ති ඒකවචන පදවල ද්විවචන බහුවචන රූප ලියන්න.

| ඒකවචන | ද්විවචන | බහුවචන |
|---|---|---|
| चक्षुषा | ...................... | ...................... |
| कर्णेन | ...................... | ...................... |
| मुखेन | ...................... | ...................... |
| दन्तेन | ...................... | ...................... |
| अङ्गुल्या | ...................... | ...................... |

**ක්‍රියාකාරකම 2.8**

०१. मया अधुना सत्यं ज्ञातम्।
०२. त्वया किम् अभिहितम्।
०३. तेन ते पृष्टाः।
०४. अनेन दुरात्मना मे दारको भक्षितः।
०५. नापितेन सर्वः क्षपनकवृत्तान्तं तेषां निवेदितः।

01. ඉහත වාක්‍ය සිංහලට පරිවර්තනය කරන්න.
02. එම වාක්‍යයන්හි ඇති තෘතීයා විභක්ති පද තෝරා ඒවායෙහි අර්ථ ද ලියන්න.
03. පහත සඳහන් ප්‍රථමා විභක්ති පද තෘතීයා විභක්තියටත් තෘතීයා විභක්ති පද ප්‍රථමා විභක්තියටත් හරවා ලියන්න.

| ප්‍රථමා | තෘතීයා | | තෘතීයා | ප්‍රථමා |
|---|---|---|---|---|
| दासः | | | सेवकेन | |
| कपिः | | | भूपतिना | |
| नरः | | | मार्जारेन | |
| लता | | | कृषीवलेन | |
| फलं | | | अरिना | |
| बुद्धः | | | मूषिकेन | |
| मुनिः | | | पुष्पेन | |
| धेनुः | | | श्रावकेन | |
| गङ्गा | | | पिता | |
| माता | | | जिह्वया | |

- सह, समं, सार्धं, सदृशः, साकं, किं, प्रयोजनं, अर्थः, යන ශබ්ද යෝගයෙහි තෘතීයා විභක්තිය වේ.

शिशुः बिडालेन सह क्रीडति।
केनाऽपि सर्धं कलहं न कुर्यात्।

०१. अहं गुरुणा सार्धं ग्रामं गच्छामि।
०२. वराहः शाबकैः सह वनगुम्बं प्रविशति।
०३. प्रज्ञया सदृशा गमः।
०४. नास्ति तृष्णासमं तोयं।
०५. किं तेन धनेन।

**ක්‍රියාකාරකම 2.9**

01. ඉහත වාක්‍යවල ඇති තෘතීයා විභක්තිය හා සම්බන්ද කොටස් උපුටා පද දක්වන්න.
02. ඉහත වාක්‍යවල අර්ථ ලියන්න.
03. සහාදී නිපාත යෝගයේ තෘතීයා විභක්තිය යෙදෙන වෙනත් නිදසුන් 5ක් ලියා දක්වන්න.
04. පහත සඳහන් වාක්‍යවලට යෝග්‍ය තෘතීයා පද හා සහාදී නිපාත පද වරහන් තුළින් තෝරා අඩුතැන් පුරවන්න.

०१. राजा .................. विदेशं गच्छति।
०२. बुद्धः .................. वाराणशिं गच्छति।
०३. मे .................. देवः नास्ति।
०४. लोके .................. कश्चित् नास्ति।
०५. भवन्तः .................. क्रीडन्तु।

(गुरुना सार्धं / अस्माभिः साकं /अमात्यैः सह / बुद्धेन सदृशः/ श्रावकैः सार्धं)

- ශාරීරික විකෘතිතා දැක්වීමෙහි ද තෘතීයා විභක්තිය භාවිත වේ.

०१. सः चक्षुभ्याम् अन्धः।
०२. सः पादेन खञ्जः।
०३. सः हस्तेन कुणिः।
०४. सः कर्णाभ्यां बधिरः।
०५. सः वचसा मूघः।

## ක්‍රියාකාරකම 2.10

01. ඉහත වාක්‍යවල ඇති තෘතීයා විභක්ති පද ලියන්න.
02. अन्धः/ खञ्जः/ कुणिः/ बधिरः/ मूघः යන වචනවල තේරුම ලියන්න.
03. ඉහත වාක්‍යවල අර්ථ ලියා දක්වන්න.
04. වරහන් තුළ ඇති වචන සුදුසු සේ යොදා පහත වාක්‍ය සම්පූර්ණ කරන්න.

०१. ते शिष्याः चक्षुभिः................।
०२. ते नराः सर्वदा कर्णैः................।
०३. ते वृषभाः उत्पत्यै ................।
०४. ते गायकाः सदैव पादैः................।
०५. ते मूधाः नित्यं वचसा ................।
(अन्धः/ मूघाः/ खञ्जः/ बधिराः/ कुणिः)

හේත්වර්ථයෙහි ද තෘතීයා ව භාවිත වේ.

०१. सत्येन कीर्तिं प्राप्णोति।
०२. यत्तेन जयं लभते।
०३. दानेन सुखं लभते।
०४. दीपेन आलोकं भवति।
०५. द्रोहेन नरकं याति।

## ක්‍රියාකාරකම 2.11

01. ඉහත වාක්‍යවල ඇති තෘතීයා විභක්ති පද ලියා දක්වන්න.
02. එම වාක්‍යවල අර්ථ ද ලියා දක්වන්න.

03. වරහන් තුළින් සුදුසු වචන තෝරා පහත වගුව සම්පූර්ණ කරන්න.
(धर्माभ्याम् / बीजात् / उडुपैः/ अगधेन / सत्याभ्याम्)

| | | |
|---|---|---|
| सत्येन | .................. | सत्यैः |
| .................. | अगदाभ्याम् | अगधैः |
| उडुपेन | उडुपाभ्याम् | .................. |
| धर्मेन | .................. | धर्मैं |
| .................. | बीजाभ्याम् | बीजै |

- ප්‍රකෘති, නාම, ගෝත්‍ර ආදි ශබ්දයන්ගේ යෝගයෙහි තෘතීයා ව වේ.

प्रकृत्या चारुः ।
नाम्ना रावणः ।
गोत्रेण गौतमः ।

- කිසියම් ලකුණක ආධාරයෙන් යමකු හඳුනා ගැනේ නම් එම ලකුණ කියැවෙන පදය තෘතීයාවෙන් තැබේ.

काषायवस्त्रेण जानामि तं बुद्धपुत्रः ।

- මිල ප්‍රකාශ කිරීමේදී අදාළ මිල ප්‍රකාශිත පදය තෘතීයාවෙන් යෙදේ.

दशरूप्यकेन क्रीतं पुस्तकमिदम् ।
सहस्रेण क्रीतं चीवरमिदम् ।

- ගමනාර්ථවත් ධාතුන්ගේ යෝගයෙහි වාහන, සාධන, දිශා යන අර්ථයන්හි තෘතීයා වේ.

सर्वं त्यक्त्वा अनेन मार्गेण गन्तव्यम् ।

- ලෙස යන අර්ථය මතු කෙරෙන පදය තෘතීයාව ඇසුරු කරයි.

शिष्यं पुत्रेण पश्यति ।
चिन्तयति मात्रा परदारम् ।

හිස්තැන් පුරවමු.

01. කර්තෘ කාරකයෙහි .................. විභක්තිය වේ.
02. කරණාර්ථයෙහි .................. විභක්තිය වේ.
03. සහාදී යෝගයෙහි .................. විභක්තිය වේ.
04. අඞ්ගවිකාරාර්ථයෙහි.................. විභක්තිය වේ.
05. හේතු අර්ථයෙහි.................. විභක්තිය වේ.
06. ඉත්ථම්භූතාර්ථයෙහි .................. විභක්තිය වේ.

आकारैरिङ्गितैर्गत्या - चेष्टयाभाषणेन च।
नेत्रवक्त्रविकारैश्च - लक्षतेन्तर्गतंमनः॥

හැසිරීමෙන්, ඉඟිවලින්, ගමනින්, සිනහවෙන්, කථාවෙන්, නෙත්වල හා මුහුණේ වෙනස්කම්වලින් ඇතුල් සිත දක්නා ලැබේ.

## 04. චතුර්ථී විභක්තිය (සම්ප්‍රදාන කාරකය)

යමෙක් යමකුට මැනවින් යම් දෙයක් දෙනු ලැබේ ද, එම දීම පිළිගනු ලබන්නා සම්ප්‍රදාන යයි කියනු ලැබේ. (යස්මෛ දීයතෙ ස සම්ප්‍රදානම්) සම්ප්‍රදාන අර්ථයෙහි චතුර්ථී විභක්තිය යෙදේ.

पुत्राय क्षीरं ददाति।
पुरुषः मोक्षाय यतते।
दरिद्राय धनं ददाति।

සම්ප්‍රදාන තෙවැදෑරුම් වේ. ඒ ප්‍රේරක, අනුමන්තෘ හා අනිරාකතෘ වශයෙනි.

01. ප්‍රේරක - යමක් මට දෙවයි ඉල්ලා එය ලබන්නා යි.
यच्छति माता तापसाय भिक्षाम्।
02. අනුමන්තෘ - දීම අනුමත කරන්නා යි.
छात्रः उपाध्याय रथं वितरति।
03. අනිරාකතෘ - පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම නොකරන්නා යි.

गोपी कृष्णाय श्लाघते।

**ක්‍රියාකාරකම 2.12**

०१. याचकाय आहारं ददाति।
०२. नृपः सेवकेभ्यः त्यागानि ददाति।
०३. वृक्षाय जलं ददाति।
०४. उपासकः भिक्षवे आहारं ददाति।
०५. कृषीवलः धेनवे औषधं ददाति।

01. ඉහත වාක්‍යවල ඇති චතුර්ථී විභක්ති පද ලියා දක්වන්න.
02. එම වාක්‍යවල අර්ථ ලියා දක්වන්න.
03. පහත වගුවේ ඇති ඒකවචන පද වලට නියමිත ද්විවචන හා බහුවචන ලියන්න.

| | | | |
|---|---|---|---|
| १. | मुनेः | ........................................ | ........................................ |
| २. | देवाय | ........................................ | ........................................ |
| ३. | राज्ञे | ........................................ | ........................................ |
| ४. | वध्वै | ........................................ | ........................................ |
| ५. | नद्यै | ........................................ | ........................................ |

**नमः**, **स्वस्ति**, **ස්වධා, අලම්, ස්වාහා වෂට්** යන නිපාතයන් හා **හිත** ශබ්දය සමග යෙදෙන්නේ ද චතුර්ථී විභක්තිය යි.

मातृ-पितृभ्यां **नमः**।
प्रजाभ्यः **स्वस्ति**।
राज्ञाय **स्वधा**।
सर्वज्ञाय **स्वाहा**।

**ක්‍රියාකාරකම 2.13**

०१. नमः समन्तभद्राय।
०२. स्वस्ति ते होतु सर्वदा।
०३. अलं सीता रामाय।
०४. इन्द्राय स्वाहा।
०५. देवाय स्वधा।

01. ඉහත සඳහන් වාක්‍යවල ඇති චතුර්ථී විභක්ති පද වෙන්කර දක්වන්න.
02. ඉහත වාක්‍ය සිංහලට පරිවර්තනය කරන්න.
03. **නමඃ, ස්වස්ති, ස්වධා, අලම්, හිතම්, ස්වාහා** ආදී පද කෙබඳු අර්ථ ප්‍රකාශ කරන්නේදැයි වෙන වෙන ම ලියන්න.
04. පහත ඇති වාක්‍යවලට සුදුසු වචන වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.

०१. ते पन्थानः ............................ सन्तु।
०२. क्षपणकाय............................ ।
०३. जिनः............................ ।
०४. कृष्णे देवी ......................... तुभ्यः।
०५. सदा............................ भवन्तु ।

(नमो/ शिवाः/ नमोस्तु / नमो / स्वस्ति)

• රුචි කිරීම්, කැමති වීම් අර්ථය ඇති ධාතුන්ගෙන් සෑදුන ක්‍රියා ඇති වාක්‍යයක එම සන්තෝෂය ලබන්නා චතුර්ථී විභක්තියෙන් යෙදේ.

बालकेभ्यः रोचते मोदकम्।
तस्मै रोचते मोक्षम्।

• ක්‍රෝධ, ද්‍රෝහ, ඊර්ෂ්‍යාදියට ලක්වන්නා ද චතුර්ථී විභක්තියෙන් යෙදේ.

मित्राय क्रुध्यति, द्रुह्यति, ईर्ष्यति, ।
कवये असूयति।

**ක්‍රියාකාරකම 2.14**

०१. गिलानाय औषधं रोचते ।
०२. पुण्यवन्तेभ्यः उपदेशं हितम्।
०३. दुर्वाशाऋषिः शाकुन्तलायै शपते।
०४. देवदत्तः बुद्धाय ईर्ष्यति।
०५. मूर्खः पुण्यवन्तेभ्यः क्रुध्यति।

01. ඉහත වාක්‍ය සිංහලට පරිවර්තනය කරන්න.
02. ඉහත සඳහන් වාක්‍යවල ඇති චතුර්ථී විභක්ති පද ලියන්න.
03. පහත දී ඇති වාක්‍යවල හිස්තැනට සුදුසු රෝචනාර්ථ, ද්‍රෝහාර්ථ, වරහන තුළ ඇති වචනවලින් තෝරා හිස්තැන් පුරවන්න.

**ක්‍රියාකාරකම 2.15**

०१. श्रमणाय सत्यं.................. ।
०२. धनिकाय कृपणः.................. ।
०३. यौवनाय वृद्धः.................. ।
०४. परमेश्वरः मकरध्वजाय .................. ।
०५. सत्यवादिः वञ्चकाय .................. ।
(द्रुह्यति / रोचते / ईर्ष्यति/ क्रुध्यति / शपते)

ක්‍රියාව යම් ප්‍රයෝජනයක් උදෙසා පවතී ද එම ප්‍රයෝජන දැක්වෙන පදය (තාදර්ථ්‍යයෙහි) චතුර්ථී විභක්තිය ඇසුරු කරයි.

निर्वाणाय धर्मं धत्ते।
संयमाय ज्ञानं धत्ते।

**ක්‍රියාකාරකම 2.16**

०१. मम प्रयत्नं राज्याभ्युदयै ।
०२. बुद्धः मोक्षाय धर्मं अदेशयत् ।
०३. संयमाय श्रुतं धत्ते ।
०४. प्रजायै गृहमेधिनाम् ।
०५. सत्याय मितभाषिणाम् ।

01. ඉහත වාක්‍ය සිංහලට පරිවර්තනය කරන්න.

02. ඉහත සඳහන් වාක්‍යවල ඇති චතුර්ථී විභක්ති පද තෝරන්න.

03. පහත වාක්‍යවල හිස්තැන්වලට සුදුසු වචන වරහන් තුළින් තෝරා ලියන්න.

०१. .................. श्रुतं धत्ते ।
०२. .................. फलन्ति वृक्षाः ।
०३. .................. सम्भृततानाम् ।
०४. .................. सद्धर्मं भवति ।
०५. .................. पापं वर्तते ।

(विनाशाय / मोक्षाय/ त्यागाय / परोपकाराय / संयमाय)

ණය හිමි පුද්ගලයා ද පැවසෙනුයේ චතුර්ථී විභක්තියෙනි.

कृष्णाय सहस्रं धारयति राधा ।

ක්‍රියාවේ අර්ථය යමකුගේ ඵලය පිණිස පවතී ද එකී ඵලය ලබන්නා චතුර්ථී විභක්තියෙන් කියැවේ.

माता जीवति पुत्राय ।
गुरुः छात्राय श्राम्यति ।

**ක්‍රියාකාරකම 2.16**

01. පහත පද්‍යයන්ගෙන් අර්ථවත් වාක්‍ය නිර්මාණය කරන්න. ඒවායෙහි තේරුම් ද ලියන්න.

दरिद्रेभ्यो धनं देहि ज्ञानायाऽव्ययनं कुरु ।
नमः श्रीरघुनाथाय स्वस्ति तुभ्यं महीपते ॥
स्वाहाऽग्नये स्वधा पित्रे रोगिणे हितमौषधम् ।
शिशवे रोचते क्रीडा नृपः क्रुध्यति दस्यवे ॥

02. හිස්තැන් පුරවන්න.

01. සම්ප්‍රදාන අර්ථයෙහි .................. විභක්තිය ගනී.
02. ආශිර්වාද, ගෞරවාදිය ලබන්නා .................. විභක්තිය ගනී.
03. ක්‍රෝධයට, ද්‍රෝහාදියට ලක්වන්නා .................. විභක්තිය ගනී.
04. තාදර්ථ්‍යයෙහි .................. චතුර්ථී විභක්තිය වේ.

त्यागायसम्भृतार्थानाम् - सत्यायमितभषिणाम्।
यशशेविजिगीशूनां - प्रजायैगृहमेधिनाम्॥

**දීම පිණිස රැස් කරන ලද ධනය ඇති, සත්‍යය සඳහා ටිකක්**
**කථා කරන සුලු වූ, කීර්තිය සඳහා සතුරන් දිනනු කැමති, පරම්පරාව**
**සඳහා දාර පරිග්‍රහණය කරන සුලු වූ**

दुर्जनः परिहर्तव्यो विद्ययाऽलङ्कृतोऽपि सन्।

දුදනා ශාස්ත්‍රඥානයෙන් බැබළුණේ නමුත් දුරුකළ යුතු ය.

दोषग्राही गुणत्यागी पल्लोलीव हि दुर्जनः।

දුර්ජනයා පෙනේරය මෙන් ගුණ හැර වැරදි දේ පමණක් ගනියි.

नाल्पीयान्बहु सुकृतं हिनस्ति दोषः।

කරන ලද බොහෝ පින් අල්ප වූ වැරදි යටපත් කරයි.